ECSL
Ethics Excellence Education

# වාර්ෂික වාර්තාව

## 2019

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව

# වාර්ෂික වාර්තාව 2019

## ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව

# පටුන

**ඉතිහාසය**

**හැඳින්වීම**

ආයතනික තොරතුරු

2019 වර්ෂයේ දී ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව ආරම්භ කිරීම.

**සටහන**

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව සහ ජාතික වගකීම

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ කාර්යයන්

ඉංජිනේරු වෘත්තිකයන් අයත් කාණ්ඩ සහ සුදුසුකම් හඳුනා ගැනීම.

**සභාපතිතුමාගේ පණිවිඩය**

**සංවිධාන ව්‍යුහය**

සභාව

කාර්ය මණ්ඩලය

සභාවේ සාමාජිකයන් පිළිබඳ කෙටි සටහන

**ඡායාරූප**

**පරිපාලනමය කටයුතු වලට අදාල විශේෂ අවස්ථා**

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව ස්ථාපනය කිරීම

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවට අමාත්‍යාංශයේ සහයෝගය

සභාව ස්ථාපනය කිරීම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම

සමාරම්භක උත්සවය

ශ්‍රී ලංකාවේ ''ඉංජිනේරුවරුන්ගේ දිනය'' ප්‍රකාශයට පත් කිරීම

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව සඳහා ලාංඡනය තෝරා ගැනීම

සභාවේ රැස්වීම්

කාර්යාලය ස්ථාපනය කිරීම

සේවක සංඛ්‍යාව අනුමත කිරීම සඳහා සම්බන්ධීකරණ කටයුතු

නිල වෙබ් අඩවිය එළිදැක්වීම

කාර්ය මණ්ඩලය

මූල්‍ය තත්වය

**සම්පූර්ණ කරන ලද සහ දැනට සිදු කෙරෙමින් පවතින කාර්යයන්**

ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම

සම්පූර්ණ කරණ ලද කාර්යයන්

දැනට සිදු කෙරෙමින් පවතින කාර්යයන්

**ඉංජිනේරු සභාවේ අනාගතය**

**මූල්‍ය ප්‍රකාශන**

**විගණනය කළ ගිණුම් සහ විගණන වාර්තාව**

## ඉතිහාසය

ශ්‍රී ලංකාවේ බොහෝ ස්ථානවලදී හමුවන විවිධාකාර ඓතිහාසික ස්මාරක ශතවර්ෂ කිහිපයකට හෙවත් බොහෝ පරම්පරා ගණනකට ඉහත, ශ්‍රී ලාංකීය ජාතිය විසින් නිර්මාණය කරන ලද අද්විතීය විශිෂ්ඨත්වය දනවන ඉංජිනේරුමය හා තාක්ෂණික දියුණුවට විපුල සාක්ෂි දරයි. නූතන ලෝකයේ තාක්ෂණයෙන් ඉතාමත් ඉදිරියෙන් සිටින රටවල් බොහෝමයක් තිබෙන නමුත් මීට ශතවර්ෂ ගණනාවකට පෙර අපගේ රට එකල තාක්ෂණයෙන් ඉතාමත් දියුණුව පැවති බවට එකල ගොඩනගන ලද පෞරාණික ආගමික සංකීර්ණවල පිහිටා ඇති යෝධ නිර්මාණ හා විශාල වාරිමාර්ග පද්ධති වලින් පෙනී යයි.

බ්‍රිතාන්‍ය පාලන සමය තුලදී විධිමත් වූ සමකාලීන ඉංජිනේරුමය සහ තාක්ෂණික අධ්‍යාපනය ආරම්භ කරන ලද අතර එය ක්‍රමයෙන් වර්ධනය වී ශ්‍රී ලාංකීය ඉංජිනේරුවරුන් නවීන තාක්ෂණය භාවිත කරමින් රටේ සංවර්ධනය සඳහා ව්‍යාපෘති රාශියක් සිදුකර ඇත. රාජ්‍ය අනුග්‍රහය ලබන නියාමන ආයතන මගින් බටහිර හා දේශීය වෛද්‍ය ක්‍රම වැනි ඊට සමාන්තර වෘත්තීයන් කිහිපයක් තරමක් දුරට හෝ නියාමනය කරනු ලැබුව ද ඉංජිනේරු වෘත්තිය උදෙසා එවැනි නියාමන ක්‍රමවේද හඳුන්වාදීම සම්බන්ධයෙන් ප්‍රමාදයක් සිදුවී ඇත. මෙම තත්වය තුල ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව ස්ථාපනය කිරීම, ප්‍රාග් ඓතිහාසික යුගවල සහශ්‍ර කීපයක් දක්වා විහිදෙන ප්‍රත්‍යක්ෂ වූ මූලයන් සහිත මව්බිමේ දීර්ඝ කාලයක සිට ගෞරවාදරයට පාත්‍ර වූ ඉංජිනේරු වෘත්තියේ සුවිශේෂී සන්ධිස්ථානයක් වනු ඇත.

ලෝකයේ අනෙකුත් ජාතීන් විසින් ක්‍රියාවට නංවා තිබෙන ආකාරයේ සංවිධානාත්මක ජාතික නියාමන ආයතනයක් ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව කලක සිට ශ්‍රී ලංකාවේ ඉංජිනේරු වෘත්තිය කෙරෙහිද අවධානය යොමු වී තිබුණි. ශ්‍රී ලංකාවේ අදාල වෘත්තීය ආයතන විසින් සුදුසු නියාමන ආයතනයක් ස්ථාපනය කිරීම පිළිබඳව රජයට අවධාරණය කර සිටීමට මුලපිරුනේ මීට වසර 25 කට පමණ ඉහතදීය. පාර්ශවකරුවන් අතර පැවති සාකච්ඡා සහ කලින් කලට පත් වූ රජයන්ගෙන් ලැබුණු පහසුකම් හා නායකත්වය යන කරුණු සියල්ල එක්ව 2017 වර්ෂයේදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පාර්ලිමේන්තු පනතක් මගින් අවශ්‍ය නෛතික බලය ලබා දීම සිදු කරන ලදී.

ඒ අනුව ප්‍රථම ඉංජිනේරු සභාව පත් කිරීම සහ 2018 අගෝස්තු 24 දිනය ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ නිල ආරම්භක දිනය බවට පත් කරමින් නිල ප්‍රකාශයක් 2018 දෙසැම්බර් 16 සහ 19 දින වල ජාතික පුවත්පත් වල පල කරන ලදී.

ඓතිහාසික සිදුවීම් මාලාවේ උච්චතම අවස්ථාව සනිටුහන් කරමින් ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ කාර්යාලය වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉහල

මාලයේ ස්ථාපනය කොට අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් වර්ෂ 2019 සැප්තැම්බර් 17 වන දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

## හැඳින්වීම

2017 මාර්තු 10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ගැසට් පත්‍රයේ II කොටසට අතිරේකයක් වශයෙන් පල කරන ලද 2017 අංක 04 දරණ ශ්‍රී ලංකා ඉංජිනේරු සභා පනත යටතේ ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව (ECSL) ස්ථාපනය කර ඇත.

**මෙම පනත මගින්,**

- ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීමය තත්වය හා චර්යාව පවත්වාගෙන යාම සහ මෙහෙයවීමේ වගකීමටද
- ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීමටද
- ඒ හා සම්බන්ධ කාරණා හෝ ඊට අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලසීමටද

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවට බලය පවරනු ලබයි.

## ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම

පනත අනුව සියළුම ඉංජිනේරු වෘත්තිකයන් ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ලියාපදිංචි විය යුතුය. පනතේ අර්ථ නිරූපනය කර ඇති පරිදි ඉංජිනේරු වෘත්තිකයන් අයත් වන කාණ්ඩ

- වරලත් ඉංජිනේරු
- ආශ්‍රිත ඉංජිනේරු
- අනුබද්ධ ඉංජිනේරු
- සංස්ථාගත ඉංජිනේරු
- ඉංජිනේරු ඩිප්ලෝමාධාරී
- ඉංජිනේරු කාර්මික

ශ්‍රී ලංකාව තුල සේවයේ යෙදෙන විදේශීය ඉංජිනේරු වෘත්තියකයින්, මාස හතරක කාල පරිච්ඡේදයක් සඳහා තාවකාලික ලියාපදිංචි කිරීමේ පහසුකම් සැපයීමට ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව අදහස් කරන අතර, ඔහුගේ/ඇයගේ අදාල සුදුසුකම් පිළිබඳ ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව සෑහීමට පත් වන්නේ නම් ඉංජිනේරු සභාවේ අභිමතය පරිදි එම ලියාපදිංචිය තවදුරටත් දීර්ඝ කල හැකි වන්නේය.

## ආයතනික තොරතුරු

**සංවිධානයේ නම**

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව

**නෛතික ස්වරූපය**

රජයට අයත් නියාමන ආයතනයකි.

**ස්ථාපනය කරන ලද වසර**

2017 අංක 4 දරණ පාර්ලිමේන්තු පනත මගින් 2017 වසරේ දී

**රේඛීය අමාත්‍යාංශය**

වාරිමාර්ග අමාත්‍යාංශය

**ආරම්භ කල දිනය**

2018 අගෝස්තු 24

**නීති උපදේශක**

රුවනි හපුආරච්චි මහත්මිය

**ප්‍රධාන කාර්යාලය**

4 වන මහල, වාරිමාර්ග දෙපාර්තමේන්තු පරිශ්‍රය
230, බෞද්ධාලෝක මාවත, කොළඹ 07
දුරකථන අංකය - 0112588811
ඊ මේල් - registrar@ecsl.lk
Web site – www.ecsl.lk

**බැංකු කරුවන්**

ලංකා බැංකුව

**බදු හඳුනා ගැනීමේ අංකය**

102769228021920003

**පනත අනුව පාර්ශවකරුවන්**

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය
ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරු ආයතනය
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

# 2019 වර්ෂයේදී ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සමාරම්භය




දීර්ඝකලීන ජාතික අවශ්‍යතාවක් වී තිබූ ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව [ECSL] අවසානයේදී 2019 සැප්තැම්බර් 17 වෙන දින උත්සවාකාරයෙන් ස්ථාපනය කරන ලදී.

එය ශ්‍රී ලංකා රජයේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය හා බැඳුණු කොටසක් වන අතර ශ්‍රී ලංකාවේ ඉංජිනේරු වෘත්තිය සඳහා ඇති ඉහලම නියාමන ආයතනය වේ.

2017 අංක 4 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු සභා පනත මගින් ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවට බලතල හිමිවන අතර පනතේ අදාළ උප ලේඛනයේ දක්වා ඇති පරිදි එම සුදුසුකම් දරන්නාවූ වෘත්තිකයන් ලියාපදිංචි කිරීමේ කාර්ය සහ ශ්‍රී ලංකාව තුළ ඉංජිනේරු වෘත්තිය නියාමනය කිරීම මෙන්ම නියෝජනය කිරීම ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවට පැවරී ඇත.
මෙම වාර්ෂික වාර්තාව මගින් සභාවේ ස්වකීය ඓතිහාසික සමාරම්භක වර්ෂය තුළ වර්ධනීය කාර්යයන් සහ සභාවේ කාර්ය සාධනය පිලිබඳ අනෙකුත් වැදගත් විස්තර සංෂිප්තව නිරූපනය කරනු ලබයි .

## සටහන

## ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව සහ එහි ජාතික වගකීම

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව ස්ථාපිත කිරීම මවුබිමේ ගෞරවණීය ඉංජිනේරු වෘත්තීය සඳහා වූ පෙර නොවූ විරූ සුවිශේෂී සන්ධිස්ථානයක් විය. එය ප්‍රාග් ඓතිහාසික යුගවල සහස්‍ර කිහිපයක් දක්වා විහිදෙන ප්‍රත්‍යක්ෂ මූලයන්ගෙන් සමන්විතය. කලක සිට ලොව පුරා ඉංජිනේරු වෘත්තියේ සමකාලීන සමස්ථිතික අභිලාශයන් අනෙකුත් දියුණු ජාතීන් ක්‍රියාවට නංවන ආකාරයටම සංවිධානාත්මකව නියාමන මෙන්ම නියෝජන ජාතික ආයතනයක් ස්ථාපනය කිරීමේ ජාතික අවශ්‍යතාවය පිළිබඳව සිහි ගන්වමින් ශ්‍රී ලාංකීය ඉංජිනේරු වෘත්තීය කෙරෙහි පූර්ණ අවධානය යොමු කරමින් සිටියි.

පාර්ශවකරුවන් අතර සහ ජාතික නායකත්වය සමඟ දීර්ඝ කාලීන සාකච්ඡා සහ විවිධ අවස්ථාවල දී පැවති රජයන්ගෙන් ලැබුණු යහපත් අනුග්‍රාහක දායකත්වය යන කරුණු සියල්ල අවසනයේ 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පාර්ලිමේන්තු පනතක් මගින් අවශ්‍ය නෛතික බලය ලබා දීම සිදු කර ඇත.

එසේ ස්ථාපනය කරණ ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවම ඉංජිනේරු වෘත්තිය නියාමනය කිරීම සඳහා ඉහලම ආයතනය බවට පත් වෙමින් ජාතික නායකත්ව සැපයීමේ සුවිසල් වගකීම එදින සිටම පැවරී ඇත. කෙටියෙන් සඳහන් කරනවා නම්, පිළිගත් සුදුසුකම් දරන්නා වූ ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කිරීම එම වෘත්තිකයන්ගේ යම් වෘත්තීමය විශමාචාර ක්‍රියාවන් පිළිබඳ විමර්ෂන සිදු කිරීම සහ ශ්‍රී ලංකාව තුල ඉංජිනේරු වෘත්තියේ යෙදීමට අදාල කාරනා පිළිබඳව රජය සහ අනෙකුත් ආයතනවල නියෝජනයන් සිදු කිරීම සඳහා එම ආයතනයට නෛතික බලය පැවරී ඇත.

## ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ කාර්යයන්

පහත සඳහන් කාර්යන් ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවට බලය පවරනු ලැබ ඇත.

- ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීය තත්වයන් පවත්වාගෙන යාම.
- ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීය චර්යාවන් පවත්වාගෙන යාම.
- ඉංජිනේරු වෘත්තිකයන් කාණ්ඩ 06 ක් යටතේ ලියාපදිංචි කිරීම.
- ශ්‍රී ලංකාව තුල ඉංජිනේරු වෘත්තියෙහි නියලීමට අදාල කාරනා පිළිබඳ රජය සහ අදාල ආයතනන්හි නියෝජනයන් සිදු කිරීම.
- ඉංජිනේරු වෘත්තිකයන්ගේ ලියාපදිංචි ලේඛන පවත්වාගෙන යාම.
- ලියාපදිංචි කරන ලද ඉංජිනේරු වෘත්තිකයන්ගේ ලැයිස්තුව වරින් වර ප්‍රසිද්ධ කිරීම
- ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීමය විෂමාචාර ක්‍රියාවන් සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම.
- සභාවේ කාර්ය මණ්ඩලයට ගෙවිය යුතු වේතන නිර්ණය කිරීම
- ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු නිර්ණය කිරීම
- ලියාපදිංචි සහතික නිකුත් කිරීම
- ඉංජිනේරු වෘත්තිකයන්ගේ ගුණාත්මක භාවය ඉහල නැංවීමට අවශ්‍ය වන වෙනත් යම් කවර වූ කාරණයක්.
- ඊට සම්බන්ධ හෝ ඊට අනුෂාංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම

## පනතේ සඳහන් පරිදි ඉංජිනේරු වෘත්තිකයන් අයත් කාණ්ඩ සහ සුදුසුකම්

**වරලත් ඉංජිනේරු**

1968 අංක 17 දරණ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ වරළත් ඉංජිනේරුවරයෙකු වීම.

**ආශ්‍රීත ඉංජිනේරු**

1968 අංක 17 දරණ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිබත් වසර හතරක පූර්ණ කාලීන ඉංජිනේරු උපාධිය හෝ 1968 අංක 17 ඉංජිනේරු ආයතන පනත මගින් පිහිටුවන කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වීම.

**අනුබද්ධ ඉංජිනේරු**

1968 අංක 17 දරණ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් වසර තුනක පූර්ණ කාලීන ඉංජිනේරු උපාධිය ලබා තිබීම.

**සංස්ථාගත ඉංජිනේරු**

1992 අංක 64 දරණ ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරුවරුන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරු ආයතනයේ සංස්ථාපිත ඉංජිනේරුවරයෙකු වීම.

**ඉංජිනේරු ඩිප්ලෝමාධාරී**

1992 අංක 64 දරණ ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරුවරුන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත මගින් පිළිගත්, පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ තාක්ෂණ විද්‍යා ආයතනයෙන් ඉංජිනේරු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**ඉංජිනේරු කාර්මික**

(i) 1990 අංක 20 දරණ තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන පනත මගින් පිහිටුවන ලද තෘතීයික අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ ඉංජිනේරු IV වන මට්ටම ජාතික වෘත්තීය සුදුසුකම (NVQ Level 4) හෝ සමාන සුදුසුකමක් ලබා තිබීම.

(ii) ඉංජිනේරු තාක්ෂණ විද්‍යාව පිළිබඳ වසර එකක පූර්ණ කාලීන අධ්‍යයන පාඨමාලාවක් හදාරා තිබීම සහ අදාල ක්ෂේත්‍රයේ වසර එකක කාර්මික පලපුරුද්දක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා රජයේ විශ්වවිද්‍යාලයකින් හෝ තාක්ෂණික හෝ තාක්ෂණ විද්‍යා ආයතනයකින් තාක්ෂණ විද්‍යාව පිළිබඳව ඩිප්ලෝමාවක් හෝ සහතිකයක් දරන්නෙකු වීම.

## සභාපතිවරයාගේ පණිවිඩය




මෙරටේ සංවර්ධනයේ කොඳුනාරටිය වන වෘත්තිකයන්ගේ කණ්ඩායමක, වසර 25 ක් පමණ කලක සිට පැවති සිහිනය සහ අරගලය, 2017 මාර්තු 10 වන දින ගැසට් පත්‍රයේ පලවූ 2017 අංක 04 දරණ පනත ප්‍රකාශයට පත් කිරීමත් සමඟ සපුරා ගැනීමට හැකි විය. එම පනත ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ **සභාව පනත** යනුවෙන් හඳුන්වනු ලැබූ අතර ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීය මට්ටම සහ චර්යාව පවත්වාගෙන යාම, ඉංජිනේරු වෘත්තිකයන්ගේ විවිධ කාණ්ඩ ලියාපදිංචි කිරීම, සහ ඊට සම්බන්ධ හෝ ඊට අනුශාංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම පිළිබඳ වගකිවයුතු ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව ස්ථාපනය කිරීම සඳහා එකී පනත මගින් ඉඩ ප්‍රස්ථා සලසන ලදී.
1924 දී ස්ථාපනය කරන ලද වෛද්‍ය සභාව ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අංශය සඳහා වගකියනු ලබන අමාත්‍යාංශය යටතේ පවතින බව පොදුවේ දන්නා කරුණකි. පොදුවේ, ඉංජිනේරුමය කාර්යන් සමඟ කටයුතු කරන අමාත්‍යාංශ කිහිපයක් තිබේ. මෙයින් ඉංජිනේරු සභාව ස්ථාපිත කිරීමේ කටයුතු ආරම්භ කරන අමාත්‍යාංශය කාගේත් අනුමානය විය.
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අත්සන් කරන ලද 2018 සැප්තැම්බර් 10 වන දිනැති ස්වකීය පත්වීමේ ලිපි ඉංජිනේරු සභාවේ අනාගත සාමාජිකයන් වෙත ලැබුණු විට අනුමානය නිමා විය. 2018 අප්‍රේල් 01 දිනැති ලිපිය මගින් ඉංජිනේරු සභවේ සභාපතිවරයා පත් කරන ලදී.
ඕනෑම නව ආයතනයක් සම්බන්ධයෙන් මෙන්ම, ශුන්‍ය ගිණුමක් සහ ඉඩකඩ නොමැති වීම ඇතුළු බාධක සමූහයකට මුල් ආරම්භක සභාවට මුහුණ දීමට සිදුවිය. මම ආරම්භක සභාපතිවරයා වශයෙන් විශේෂයෙන්ම ඉංජිනේරු සභාවේ ආරම්භක මාස 18 ක කාලය තුල කැළඹිලි සහිත අසීරු පරිසරයක් තුළ සභාව මෙහෙයවීමේදී ආරම්භක සභාවේ සියළුම සාමාජිකයන් විසින් දක්වන ලද කොන්දේසි විරහිත කැපවීම, උනන්දුව සහ වටිනා සහයෝගය මෙහිදී සඳහන් කල යුතුය. ගෙවීම් දීමනාව, සභාවාර දීමනාව, ප්‍රවාහන දීමනාව පිළිබඳ තැකීමක් නොකල අතර සභාව අත්‍යා ඉඩකඩක් තුල ස්වකීය කටයුතු පවත්වගෙන යන ලදී. මෙම කාල පරිච්ඡේදය තුළ ඉංජිනේරු සභාවේ රැස්වීම් භෞතිකව පැවැත්වීම සඳහා ස්වකීය ඉඩකඩ භාවිතා කිරීමට අවසර ලබා දීම වෙනුවෙන් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ පරිපාලනයට සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයට ස්තුතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.
ශූන්‍ය බැංකු ගිණුම් සහිතව සභාවට ස්ථිර නිවහනක් සෙවීම ප්‍රමුඛ අභියෝගයක් විය. රජයට සහ අර්ධ රාජ්‍ය ආයතන වලට අයත්ව පවතින ස්ථාන කිහිපයක් නිරීක්ෂණය කිරීමෙන් පසු, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ඉහළ මාලයේ ඇති ඉඩකඩ සභාවට පිළිගත හැකි විය. මෙහිදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව රටතුල ස්ථාපනය කරන ලද මුල්ම ඉංජිනේරු ආයතන වලින් එකක්විම සහ බොහෝ ඉංජිනේරු වෘත්තිකයන් සභාව පවත්වාගෙන යන ගොඩනැගිල්ල සංකේතාත්මකව වැදගත් සේ සැලකීම, ගොඩනැගිල්ලේ පිහිටීම සහ ගෘහනිර්මාණ ශිල්පය සහ වාරිමාර්ග ඉංජිනේරු කටයුතු වල දී අත් කර ගෙන ඇති ස්වකීය අතීත ජයග්‍රහන වෙනුවෙන් ගෝලීය වශයෙන් ශ්‍රී ලංකාව පිලිගැනීම වැනි ප්‍රධාන කරුණු හේතු විය. ඉඩකඩ ලබා ගැනීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගැනිමේ දී සුවිශේෂී කාර්යභාරයක් ඉටුකළ වාරිමාර්ග සහ ජල සම්පත් අමාත්‍යාංශයේ එවකට ලේකම් එන්. ඒ. සිසිරකුමාර මහතාගේ සහ එම ඉඩ ආදර්ශමත් ආකාරයට නවීකරණය කර ගැනීමට වෙහෙස නොබලා කටයුතු කල එවකට වාරිමාර්ග අධ්‍යක්ෂක එස්. මොහාන් රාජා මහතාගේ දායකත්වය කෘතඥ පූර්වකව අගය කරමි.

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ රාජකාරී වගකීම් හා අභිලාෂයන් හෝ විවිධ පැතිකඩ පිළිබඳ මූලික කටයුතු කිහිපයක් ක්‍රියාත්මක කරමින් රැස්වීම් 22 පැවැත්වීමෙන් පසු ශ්‍රී ලංකාවේ කීර්තිමත් ඉංජිනේරුවරයෙකු සහ රාජතාන්ත්‍රිකයකු වන ඉංජිනේරු ඩී.ජේ. විමලසුරේන්ද්‍ර මහතාගේ 145 වන ජන්ම සංවත්සර දිනය වන වර්ෂ 2019 සැප්තැම්බර් 17 වන දින වාරිමාර්ග දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ මූලස්ථාන කාර්යාලයේ දැනට පවතින ස්ථානයේ ඉංජිනේරු සභාව නිල වශයෙන් ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ආරම්භක සභාපතිවරයා වශයෙන් මෙකී පණිවිඩය ඉතා උනන්දුවෙන් සහ අභිමානයෙන් යුතුව සකස් කළෙමි.
මෙරටේ බොහෝ ඉංජිනේරු වෘත්තිකයන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් වියදම් දරන්නා වූ ශ්‍රී ලාංකික ජනතාවගේ බලාපොරොත්තු අනුව යමින්, ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව විසින් ස්වකීය කාර්යයන් ඉටු කර ඇති බව ඉතාම සතුටින් සටහන් කරමි.
මෙරටේ සියලුම පුරවැසියන්ගේ යහ පැවැත්ම ඉහල නැංවීම කෙරෙහි අවධානය යොමු කරමින් ස්වකීය කටයුතු ශක්තිමත්ව, අඛණ්ඩව පවත්වගෙන යාම ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ පරම වගකීම වේ.
ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ අනාගත කටයුතු සර්වප්‍රකාරයෙන්ම ඉෂ්ඨ වේවායි සුභාශිංශනය කරමි.

මහාචාර්ය එස්.බී.එස්. අභයකෝන්
BSc Eng. M.A Sc. PhD. CEng. FIE (SL).Int. PEng (SL)
සභාපති

## සංවිධාන ව්‍යුහය



## සභාව

සභාව සාමාජිකයන් 17 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් 04 දෙනෙකු නිල වශයෙන් (මහාචාර්ය ධූරයට පහල ධූරයන් නොවන ඉංජිනේරු පීඨවල පීඨාධිපතිවරුන් තිදෙනෙකු සහ තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්) පත්වන සාමාජිකයන් වන අතර අනෙකුත් සාමාජිකයන් 13 දෙනා ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවට අදාල රේඛීය අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබේ.

"පත්කරනු ලබන සාමාජිකයන්" සෑම දෙවසරකට වරක් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් නම් කරනු ලබන්නා වූ විවිධ ඉංජිනේරු ක්ෂේත්‍රයන් නියෝජනය කරනු ලබන වරළත් ඉංජිනේරුවන් හත් දෙනෙකුගෙන් ද ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරු ආයතනය විසින් සෑම දෙවසරකට වරක් නම් කරනු ලබන විවිධ ඉංජිනෙරු ක්ෂේත්‍රයන් නියෝජනය කරන ලබන සාමාජිකයන් 04 දෙනෙකුගෙන් ද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය විසින් නම් කරනු ලබන වරළත් ඉංජිනේරු වරයෙකුගෙන් සහ තෘතීය හ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන ඉංජිනේරු කාර්මිකයන්ගේ නියෝජිතයෙකු ගෙන් ද සමන්විත වේ.

අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් අතරින් වරලත් ඉංජිනේරුවරුන්ගෙන් කෙනෙකු ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලබයි. 2018 වර්ෂයේ අප්‍රේල් මස පත්කරනු ලැබූ සභවේ සාමාජිකයන් පහත පරිදි වේ.

| අංකය | නම | සුදුසුකම් | තනතුර |
|---|---|---|---|
| 1. | මහාචාර්ය එස්.බී.එස්. අබයකෝන් | BSc Eng. M.A. Sc. PhD. CEng FIE (SL),Int. PEng (SL) | සභාපති |
| 2. | මහාචාර්ය එන්.කේ. වික්‍රමාරච්චි | BSc Eng. M.A. Sc. PhD. CEng FIE (SL),Int. PEng (SL) | සාමාජික (නිල බලයෙන්) |
| 3. | මහාචාර්ය ජී.බී.බී.හේරත් | BSc Eng. MEng. PhD | සාමාජික (නිල බලයෙන්) |
| 4. | මහාචාර්ය ඒ. අත්පුතරාජා | BSc Eng.(Hons) PhD. CEng MIE (SL) | සාමාජික (නිල බලයෙන්) |
| 5. | එස්.යු.කේ. රුබසිංහ | PGDBM, PGCTM, AMIE(SL) | සාමාජික (නිල බලයෙන්) |
| 6. | මහාචාර්ය ඒ.කේ. ජයවර්ධන | BSc Eng. (Hons). MSc. PhD. CEng Int. PE (SL)) FIE (SL), FIPM(SL), FNAS (SL) GSOLID. | සාමාජික |
| 7. | තිලක් ද සිල්වා මහතා | BSc Eng. MSc, CEng (SL), CEng (UK), CITP) UK) FIE (SL), FIET (UK), FBCS (UK) SMIEEE (USA), MCS(SL), | සාමාජික |
| 8. | ජේ. මීගොඩ මහතා | BSc Eng.(Hons) PGD,MBA, CEng FIE (SL),Int. PE (SL), SMIEEE (USA | සාමාජික |
| 9. | කේ.පී.අයි.යු. ධර්මපාල | BSc Eng. CEng FIE (SL), FICE (UK), FIE (Aust.), SMIEEE (USA), MSSE(SL), MACE ( SL), Int. PE (SL),PEng (Aust,) | සාමාජික |
| 10. | එම්. මනම්පේරි මහතා | BSc Eng.MS Eng, MBA, CEng, FIE (SL) | සාමාජික |
| 11. | ජේ.ඒ.ජී.ආර්. ජයලත් මහතා | BSc Eng. MSc Eng, MEcon,PG(Dip) PG ( Dip) Cons. Mgt, FIE (SL), FCIHT (UK), LM (IRC),CMILT,MSSE (SL) | සාමාජික |

| | | | |
|---|---|---|---|
| 12. | ආචාර්ය ටි. ඒ .පී . ගුණසේකර | M Eng. MSc Eng (Hons), PhD. CEng, IEng, MIE (SL), FIIE (SL) | සාමාජික |
| 13. | ඩී.එස්. සෙනරත් මහතා | MCGI (UK), IEng, MEG(SL), DTM(USA), FIIE (SL) | සාමාජික |
| 14. | කේ. ආරියවංශ මහතා | GCG(UK), MCGI(UK),IEng, MASCE (USA), MEG (SL) FIE (SL), MIAENG, FIIE (SL) | සාමාජික |
| 15. | යූ.පී.පී. කවිකේෂව මහතා | BSc. (Hons), MCGI (UK),IEng, TEng,AIE (SL), MEG ( SL), MIAENG, FIIE (SL) | සාමාජික |
| 16. | ඩී. අබේසිරිවර්ධන මහතා | BSc Eng., CEng, MIE (SL) | සාමාජික |
| 17. | වන්න විජේසේකර මහතා | IENG, FIIESL | සාමාජික |
| 18. | ආචාර්ය ආනන්ද රණසිංහ මහතා | BSc, MTech, MEng, LLM(Colombo), LLM(Wales), PhD, CEng, FISructE (UK), FICE (UK), FIE (SL) FSSE, Attorney at Law | සාමාජික |

මහාචාර්ය එස්.බී.එස්. අභයකෝන් 2018 වර්ශයේ සිට සභාපති තනතුර දැරූ අතර 2019/2020 කාලය සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සභාපති වශයෙන් රාජකරී භාර ගැනීම උදෙසා 2019 ඔක්තොම්බර් පලමුවන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සභාපති තනතුරින් සහ ඉංජිනේරු සභාවෙන් ඉල්ලා අස් විය.

තිලක් ද සිල්වා මහතා 2019 ඔක්තොම්බර් දෙවන දින සිට සභාපති තනතුරේ රාජකාරී ආවරණය කරනු ලැබූ අතර පසුව සභාපති වශයෙන් ඔහුගේ තනතුර අතිගරු ජනාධිපති තුමා විසින් 2019 ඔක්තෝබර් දෙවන දින සිට ක්‍රියත්මක වන පරිදි ස්ථිර කරන ලදී.

ආචාර්ය ආනන්ද රණසිංහ 2019 ඔක්තෝවර් 02 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සභාවේ සාමාජිකයෙකු වශයෙන් පත් කරන ලදී.

**<u>කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව</u>**

1. ප්‍රධාන විධායක නිලධාරී 01
2. ලේඛකාධිකාරී 01
3. තොරතුරු තාක්ෂණ නිලධාරී 01
4. ගණකාධිකාරී 01
5. තොරතුරු තාක්ෂණ සහකාර 01
6. කලමනාකරණ සහකාර 01
7. පෞද්ගලික සහකාර 01
8. කාර්යාල සහායක 01

<u>සභාවේ  සාමාජිකයින් පිළිබඳ කෙටි විස්තරය</u>



මහාචාර්ය එස්.බී.එස්.
අබයකෝන්
සභාපති
2018.04.10 සිට 2019.10.01
දක්වා



තිලක් ද සිල්වා
සභාපති
2019.10.15 සිට මේ දක්වා
රාජකාරි ආවරණ සභාපති
2019.02.02 සිට 2019.10.04
දක්වා
සභාවේ සාමාජික
2018.04.10 සිට 2019.10.14
දක්වා



මහාචාර්ය එන්.කේ.
වික්‍රමාරච්චි
සභාවේ සාමාජික
(නිල බලයෙන්)



මහාචාර්ය ජී.බී.බී.හේරත්
සභාවේ සාමාජික
(නිල බලයෙන්)



මහාචාර්ය ඒ. අල්පුතරාජා
සභාවේ සාමාජික
(නිල බලයෙන්)



එස්.යු.කේ. රුබසිංහ
සභාවේ සාමාජික
(නිල බලයෙන්)



මහාචාර්ය ඒ.කේ.ඩබ්.
ජයවර්ධන
සභාවේ සාමාජික



ජේ. මීගොඩ
සභාවේ සාමාජික



කේ.පී.අයි.යු. ධර්මපාල
සභාවේ සාමාජික



ඒ. මනම්පේරි
සභාවේ සාමාජික



ජේ.ඒ.පී.ආර්. ජයලත්
සභාවේ සාමාජික



ඩී. අබේසිරිවර්ධන
සභාවේ සාමාජික



ආචාර්ය ආනන්ද රණසිංහ
සභාවේ සාමාජික



ආචාර්ය ටී. ඒ .ජී .
ගුණසේකර
සභාවේ සාමාජික



ඩී.එස්. සෙනරත්
සභාවේ සාමාජික



කේ. ආරියවංශ
සභාවේ සාමාජික



ලුතිනන් කර්නල් යූ.පී.පී.
කවිකේශව
සභාවේ සාමාජික



එච්. එල්.සී.ජී. විජේසේකර
සභාවේ සාමාජික

## සුවිශේෂී අවස්ථාවල ඡායාරූප



ජනාධිපතිතුමා පිළිගැනීම



ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ කාර්යාලය විවෘත කිරීම



ඉංජිනේරු සභාවේ සාමාජිකයන් හඳුන්වා දීම





අමුත්තන්ගේ පොත අත්සන් තැබීම

සාම්ප්‍රදායික පොල්තෙල් පහන දැල්වීම





ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ වෙබ් අඩවිය එළි දැක්වීම



ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සභාපතිතුමා විසින් සභාව ඇමතීම



අතිගරු ජනාධිපතිතුමන් විසින් සභාව ඇමතීම




අතිගරු ජනාධිපතිතුමාට සමරු සටහන පිළිගැන්වීම



ආරාධිතයන් සහ
ඉංජිනේරු සභාවේ
සාමාජිකයන්



ආරාධිතයන් සහ
ඉංජිනේරු සභාවේ
සාමාජිකයන්



අධ්‍යක්ෂ වාරිමාර්ග
විසින් ස්තූති කතාව
කිරීම

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සභාපතිවරයා වෙත ලියාපදිංචි සහතිකය පිරිනැමීම



ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සභාපතිවරයා වෙත ලියාපදිංචි සහතිකය පිරිනැමීම



ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරු ආයතනයේ සභාපතිවරයා හට ලියාපදිංචි සහතිකය පිරිනැමීම



තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයා හට ලියාපදිංචි සහතිකය පිරිනැමීම



සමූහ ඡායාරූපය




## ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ පරිපාලනමය කටයුතුවල සුවිශේෂී අවස්ථා

### ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව ස්ථාපනය කිරීම

- 2017 මාර්තු 09 වන දින පාර්ලිමේන්තුව විසින් පනතක් සම්මත කරණ ලදී.
- 2018 අප්‍රේල් 10 වන දින ඉංජිනේරු සභාව පත් කරණ ලදී.
- අමාත්‍යාංශ ලේකම් අනුර දිසානායක මහතා සහ ඔහුගේ නිලධාරීන් සමඟ 2018 අගෝස්තු 10 වන දින ප්‍රථම රැස්වීම පවත්වන ලදී
- 2018 අගෝස්තු 24 වන දින ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ප්‍රථම රැස්වීම ‘‘සොබාදම් පියස’’ ගොඩනැගිල්ලේදී පවත්වන ලදී.

### අමාත්‍යාංශයෙන් ලැබුණු සහයෝගය

- ඉංජිනේරු සභාව පවත්වාගෙන යාමේ කාර්යයන් ආරම්භ කිරීම සඳහා අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු වන ආර්.ඒ.ආර්.ආර්. රූපසිංහ මහතා සහ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරියක වන ලෝෂිණී යූ. පීරිස් මහත්මිය සෑම ආකාරයෙන්ම සහයෝගය සහ උපදෙස් ලබා දෙන ලදී.

### සභාව ස්ථාපනය කිරීම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම

- 2018 දෙසැම්බර් 16 සහ 19 වන දින වල පුවත්පත් දැන්වීම් පලකිරීම මගින් ඉංජිනේරු සභාව ස්ථාපනය කිරීම පිළිබඳව ජනතාවට දැනුම් දෙන ලදී.

### සමාරම්භක උත්සවය

- ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ කාර්යාලය විවෘත කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් 2019 සැප්තැම්බර් 17 වන දින වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී උත්සවාකාරයෙන් සිදු කරන ලදී.

## ශ්‍රී ලංකා "ඉංජිනේරුවරුන්ගේ දිනය" ප්‍රකාශයට පත්කිරීම

- "ඉංජිනේරු වරුන්ගේ දිනය" ලෙස සෑම වර්ෂයකම සැප්තැම්බර් මස 17 වන දිනය අතිගරු ජනාධිපතිතුමන් විසින් ප්‍රකාශයට පත් කර ඇත.

## ලාංඡනය තෝරා ගැනීම

- ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව් සඳහා එච්.බී. දයාරත්න මහතා විසින් නිර්මාණය කරන ලද ලාංඡනය ඉංජිනේරු සභාව විසින් තෝරා ගන්නා ලදී.

## සභාවේ රැස්වීම්

- ආරම්භයේදී සභා රැස්වීම් පැවැත්වීමට සභාවට ස්ථානයක් නොතිබූ අතර එම අවස්ථාවේ දී රැස්වීම් පැවැත්වීම සඳහා අමාත්‍යාංශය විසින් ස්වකීය පරිශ්‍රය තුල ඉඩකඩ සලසා දෙන ලදී.

## කාර්යාලය ස්ථාපිත කිරීම

- වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ඉහල මහලේ ඉඩකඩ ලබා දෙමින් වාරිමාරග අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ ඔහුගේ කාර්ය මණ්ඩලය සෑම අතින්ම සහයෝගය දක්වන ලදී.
- වන්න විජේසේකර මහතා සහ ඔහුගේ කණ්ඩායම විසින් කාර්යාලයේ අභ්‍යන්තර සැකැස්ම සහ ගෘහ භාණ්ඩ ලබා දීම සිදු කරන ලදී.

## සේවක පිරිස අනුමත කිරීම සඳහා සම්බන්ධීකරණ කටයුතු

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් සේවක පිරිස අනුමත කර ගැනීම සඳහා මහාචාර්ය එස්.බී.එස්. අභයකෝන් සහ අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

## නිල වෙබ් අඩවිය එළිදැක්වීම

2019 වසරේ සැප්තැම්බර් මස 17 වන දින නිල වෙබ් අඩවිය වන www.ecsl.lk එළිදක්වන ලදී.

## කාර්ය මණ්ඩලය

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ආශ්‍රිත කටයුතු පවත්වාගෙනෙ යාම උදෙසා 2019 ඔක්තෝබර් 17 වන දින සම්බන්ධීකාරකවරයෙකු කාර්ය මණ්ඩලය සඳහා පත් කරන ලදී.

## මූල්‍ය තත්වය

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) සහ ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරු ආයතනය(IESL) භාණ්ඩාගාරයෙන් වෙන් කරන අරමුදල් ලැබෙනතුරු ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවට අදාල කාර්යයන් ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියනයක් බැගින් ණය ලබා දෙන ලදී.

## සම්පූර්ණ කරන ලද සහ දැනට සිදු කරමින් පවතින කටයුතු

### ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම

පහත සඳහන් කාණ්ඩ වලට අයත් ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම ආරම්භ කරන ලදී.

- වරලත් ඉංජිනේරු
- ආශ්‍රිත ඉංජිනේරු
- අනුබද්ධ ඉංජිනේරු
- සංස්ථාගත ඉංජිනේරු
- ඉංජිනේරු ඩිප්ලෝමාධාරී

(2019 ජනවාරි 27 හා 30 දින වල පලවූ පුවත්පත් දැන්වීම්)

වෘත්තීය කාණ්ඩය සැලකිල්ලට නොගෙන සියළු දෙනාගෙන්ම එක සමාන වාර්ෂික ලියාපදිංචි ගාස්තුවක් අය කිරීමට නිර්දේශ කරන ලදි.

2019 වර්ශයේ දී ලියාපදිංචි වූ වෘත්තිකයන් පිළිබඳ විස්තර

- වරලත් ඉංජිනේරු - 5,409
- ආශ්‍රිත ඉංජිනේරු - 10,491
- අනුබද්ධ ඉංජිනේරු - 129
- සංස්ථාගත ඉංජිනේරු - 410
- ඉංජිනේරු ඩිප්ලෝමාධාරී - 594

### සම්පූර්ණ කරණ ලද කාර්යයන්

වැඩමුළු 02 ක් පවත්වන ලදී.

- නීති උපදේශක රුවිනි හපුආරච්චි මහත්මිය විසින් ශ්‍රී ලංකා ඉංජිනේරු සභා පනතේ නෛතික පසුබිම පිළිබඳ සභාවේ සාමාජිකයන් දැනුවත් කිරීම සඳහා පලමු වැඩමුළුව පවත්වන ලදී.
- ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව පනත ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටළු සාකච්ඡා කිරීම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ඉංජිනේරු ආයතන ප්‍රධානීන්ගේ සහභාගිත්වයෙන්දෙවන වැඩමුළුව පවත්වන ලදී.

### දැනට සිදු කරමින් පවතින කටයුතු

- නීති සහ රෙගුලාසි සකස් කිරීම.
- වෘත්තීය අචාරධර්ම පද්ධතියක් සකස් කිරීම.
- පාර්ශව කරුවන් සමඟ රැස්වීම් පැවැත්වීම.
- විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම.

## ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ අනාගතය

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව, වර්තමානයේ එහි කටයුතු ගොඩනැගෙමින් පැවතිය ද ඉංජිනේරු කටයුතු පිළිබඳ ඉහලම විධිමත් සම්බන්ධීකරණයක් හරහා ආයතනය වශයෙන් දශක ගණනාවක් හෝ ශතවර්ශ ගණනාවක් වුවද ශ්‍රී ලංකාව තුල ඉදිරි නායකත්වය දීම සඳහා ව්‍යවස්ථානුකූලව සහ නෛතිකව දැඩි අධිෂ්ඨානයකින් යුතුව කටයුතු කරනු ලබයි. එම නිසා එහි අනාගත ක්‍රියාකාරකම් එහි අර්ථයෙන් ඉතා පැහැදිලි, එකින් එකට බැඳී පැවතිය යුතු බවට මැනවින් හඳුනා ගෙන ඇත.

විධිමත්ව ස්ථාපනය කරන ලද රාජ්‍ය අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව විසින් කෙටිකාලීන හා දීර්ඝ කාලීන වැඩසටහන් වශයෙන් අනාගත කටයුතු කිහිපයක් ආරම්භ කෙරෙනු ඇත.

ඉදිරි වර්ෂය තුල දී බඳවා ගැනීම් සහ අත්‍යාවශ්‍ය මුඛ්‍ය කාර්යමණ්ඩල පුහුණු කිරීම් හා අත්‍යාවශ්‍ය උපකරණ ලබා ගැනීම ආදිය වැනි ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ දියුණුව උදෙසා සිදු කරන කටයුතු වැඩි ප්‍රමාණයක් සම්පූර්ණ කිරීම සඳහා සැලසුම් ක්‍රියාවට නංවා ඇති අතර ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීමේ මූලික කාර්යන් සභාවට මෙන්ම ලියාපදිංචි වන වෘත්තිකයන් හට පහසු කාර්යක් බවට පත් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ඇත.

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව සහ ඉංජිනේරු වෘත්තිකයන් සේවයේ යොදවන්නන් වන රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය මෙන්ම පොදු ජනතාවද සමඟ සාකච්ඡා තුලින්, මුද්‍රිත තොරතුරු හා සමාජ මාධ්‍ය භාවිතයෙන් හෝ ලිපි හුවමාරු කිරීම මගින් ශක්තිමත් සංවාද ඉදිරියේදි ඇති කිරීම තවත් ප්‍රමුඛ කාර්යයක් වේ.

ඉංජිනේරු තාක්ෂණික ශිල්පීන් හා විදේශීය වෘත්තිකයන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ දී ඇතිවන මූලික ගැටළු ඉතා කඩිනමින් විසඳීම සඳහා තීරණ ගැනීම.

ශ්‍රී ලංකාව තුල සියලුම ඉංජිනේරු වෘත්තිකයන් උදෙසා වෘත්තීමය ආචාරධර්ම පද්ධතියක් සකස් කොට ක්‍රියාත්මක කිරීම ආරම්භ කරනු ඇත.

ශ්‍රී ලංකා ඉංජිනේරු වෘත්තියට අදාල සියළුම කටයුතු නියෝජනය කිරීමට ඇති ඉහලම ආයතනය වශයෙන් අවසානයේ ස්ථිර වශයෙන්ම ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවට කටයුතු කිරීමට සිදුවනු ඇත.

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව පවත්වාගෙන යාම සඳහා එහි අභිමානය රැක ගතහැකි සුදුසු පරිසරයක් තුල පරිශ්‍රය ගොඩනගා ගැනීම ඉදිරි සැලසුම් ක්‍රියාදාමයේ වැදගත් අංගයක් කර ගැනීමට අරමුණු කරගෙන ඇත.

## මූල්‍ය ප්‍රකාශනය

### මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| අවසන් වසර සඳහා | සටහන අංක | 2019 රු. '000 | | 2018 රු . '000 |
|---|---|---|---|---|
| මෙහෙයුම් කටයුතු වලින් ලද අදායම | 01 | 17,033 | | - |
| භාණ්ඩාගාර ප්‍රදාන - පුනරාවර්තන | | 3,548 | | - |
| **මුළු අදායම** | | **20,581** | | **-** |
| | | | | |
| පරිපාලන වියදම් | 21 | (2,805) | | - |
| ගිවිසුම්ගත සේවා සහ නඩත්තු වියදම් | 22 | (454) | | - |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 23 | (2,625) | | - |
| **මුළු වියදම** | | **( 5,884)** | | |
| | | | | |
| **මෙහෙයුම් වලින් අතිරික්තය/ (ඌනතාව)** | | **14,657** | | - |
| | | | | |
| බදු | | (1,086) | | - |
| **කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ (ඌනතාව)** | | **3,611** | | - |

## මූල්‍යමය තත්ත්වය පිලිබඳ ප්‍රකාශනය

| | සටහන අංක | 2019 රු. '000 | | 2018 රු . '000 |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම වත්කම්** | | | | |
| මුදල් හා මුදල් සමායනයන් | 03 | 2,038 | | - |
| මුදල් හා මුදල් සමායනයන්- කෙටි කාලින ආයෝජන | 04 | 14,000 | | |
| වෙළඳ සහ අනෙකුත් ලැබීම් | 05 | 3,731 | | - |
| පූර්ව ගෙවීම් | 06 | 30 | | - |
| | | **19,799** | | - |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල, යන්ත්‍රෝපකරණ, උපකරණ | 07 | 3,036 | | |
| | | | | - |
| **මුළු වත්කම්** | | **22,835** | | |
| | | | | - |
| **වගකීම්** | | | | - |
| **ජංගම වගකීම්** | | | | |
| අනෙකුත් ප්‍රතිපාදන හා ගෙවියුතු දෑ | 08 | 6,188 | | |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| ජංගම නොවන වගකීම් | | | | |
| විලම්බිත අදායම (රජයේ ප්‍රදාන සඳහා) | 09 | 3,036 | | |
| | | | | |
| **මුළු වගකීම්** | | **9,224** | | |
| | | | | |
| **ශුද්ධ වත්කම්** | | **13,611** | | |
| | | | | |
| **ශුද්ධ වත්කම්/ හිමිකම් ප්‍රාග්ධනය හා සංචිත** | | | | |
| දායක ප්‍රාග්ධනය | 10 | | | |
| සමුච්චිත ලාභය / (ඌනතාව) | 10 | 13,611 | | |
| **මුළු ශුද්ධ වත්කම්/ හිමිකම්** | | **13,611** | | - |

ගිණුම්කරන ප්‍රතිපත්ති සහ 05 සිට 11 දක්වා පිටුවල සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත කොටසක් වේ.
ඉංජිනේරු සභාවේ දැනට ඇති වරතාවලට අනුව ඉහත සඳහන්මූල්‍ය ප්‍රකාශන සත්‍ය සහ නිවැරදි බවට සහතික කරමි.

පී .ඒ.පී . සිල්වා
ගණකාධිකාරී (වැඩබලන)
මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සභාවේ සාමාජිකයන් වගකිම දරනු ලබයි.
ඉංජිනේරු සභාව වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලදී.

ඉංජිනේරු තිලක් ද සිල්වා .
සභාපති
ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව
2021 ක්වූ පෙබරවාරි 05 දින.

ඉංජිනේරු ඩි .එස් . සෙනරත්
සභාවේ සාමාජික

## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | 2019 | | 2018 | |
|---|---|---|---|---|
| | රු. ‘000 | | රු. ‘000 | |
| **මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය** | | | | |
| භාණ්ඩාගාර ප්‍රදාන වලට පෙර වර්ශයේ අතිරික්තය (ඌනතාවය ) (පුනරාවර්තන ) | | 11,149 | | |
| එකතු කළ: ලැබුණු භාණ්ඩාගාර ප්‍රධාන (පුනරාවර්තන) | | 3,548 | | |
| වර්ෂයේ බදු වලට පෙර අතිරික්ත / (ඌනතාවය ) | | **14,697** | | |
| **මුදලින් නොවූ ගණුදෙනු** | | | | |
| ගෙවිය යුතු මුදල් වැඩි වීම | 5,102 | | | |

| | | | | |
|---|---|---|---|---|
| අනෙකුත් ජංගම වත්කම් ඉහල යාම | (3,761) | 1,341 | | |
| **මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **16,038** | | |
| | | | | |
| **ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය** | | | | |
| දේපල යන්ත්‍රෝපකරණ හා උපකරණ මිලදී ගැනීම | (3,140) | | | |
| **ආයෝජන කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(3,140)** | | |
| | | | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | | |
| රජයේ ප්‍රධාන ( දේපල යන්ත්‍රෝපකරණ හා උපකරණ සඳහා ප්‍රාග්ධනය ) | 3,140 | | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **3,140** | | |
| **මුදල් හා මුදල් සමානාත්‍යන්හි ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)** | | **16,038** | | |
| කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් හා මුදල් සාමානාත්‍යන් | | - | | |
| **කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල් සමායනයන්** | | **16,038** | | |

## <u>මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා සටහන්</u>

මුදල් හා මුදල් සමායනයන් බැංකු ශේෂයන්ගෙන් සමන්විතවේ. මුදල් හා සාමායනයන් ඇතුලත් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනයේ පහත සඳහන් මූල්‍ය තත්ත්ව ප්‍රමාණයන් ඇතුලත් වේ.

| | **2019** | **2018** | |
|---|---|---|---|
| | **රු. '000** | **රු. '000** | |
| බැංකුවේ ජංගම ගිණුමේ ශේෂය(සටහන අංක 03) | 2038 | | |
| ආයෝජන- ස්ථාවර තැන්පතු (කෙටි කාලීන ) (සටහන අංක 04 ) | 14,000 | | |
| | **16,038** | | |

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**මෙහෙයුම් කටයුතු වලින් ලද ආදායම**

| | 2019 | 2018 |
|---|---|---|
| **සටහන අංක :01** | **රු. '000** | **රු. '000** |
| **ලියාපදිංචි කිරීම** | | |
| වරලත් ඉංජිනේරුවන් | 5,409 | |
| ආශ්‍රිත ඉංජිනේරුවන් | 10,491 | |
| අනුබද්ධ ඉංජිනේරුවන් | 129 | |
| සංස්ථාගත ඉංජිනේරුවන් | 410 | |
| ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන් | 594 | |
| මුළු එකතුව | **17,033** | |
| **වියදම්** | | |
| **සටහන් අංක 2:1** | | |
| **පරිපාලන පිරිවැය** | | |
| වැටුප් සහ වේතන | 918 | |
| සභාවේ සාමාජිකයන්ගේ දීමනා | 1,887 | |
| එකතුව | **2,805** | - |
| **සටහන 2:2** | | |
| **ගිවිසුම් ගත සේවා සහ නඩත්තු වියදම්** | | |
| තැපැල් හා දුරකථන ගාස්තු | 18 | |
| තොරතුරු තාක්ෂණ වියදම් | 165 | |
| සංග්‍රහ | 68 | |
| විගණන ගාස්තු | 75 | |
| මුද්‍රණ | 34 | |
| උපදේශන ගාස්තු | 49 | |
| විවිධ වියදම් | 33 | |
| කාර්යාල උපකරණ නඩත්තු කිරීම | 12 | |
| එකතුව | **454** | |
| **සටහන අංක 2:3** | | |
| **අනෙකුත් මෙහෙයුම් වියදම්** | | |
| ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 3 | |
| වාර සඟරා සහ පුවත්පත් | 600 | |
| බැංකු ගාස්තු | 3 | |
| ගෙවන ලද පොලිය | 3 | |
| වෙනත් මෙහෙයුම් වියදම් | 2,616 | |
| එකතුව | 2,625 | |
| | | |
| මුළු එකතුව | 5,884 | |

| | 2019 | 2018 | |
|---|---|---|---|
| **සටහන අංක :03** | **රු. '000** | **රු. '000** | |
| **මුදල් සහ මුදල් සමායයන්** | | | |
| (1) ලංකා බැංකුව (නිදහස් චතුරස්‍රය)(ජංගම ගිණුම් අංක 83585687) | 1,570 | | |
| (2 ) ලංකා බැංකුව (නිදහස් චතුරශ්‍රය ) (ජංගම ගිණුම් අංක 83591633) | 453 | | |
| අත් මුදල් | 15 | | |
| **මුළු එකතුව** | **2,038** | | |
| **සටහන් අංක 04** | | | |
| **මුදල් හා සමානයන් - ආයෝජන (කෙටිකාලීන )** | | | |
| (1) ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව (නිදහස් චතුරශ්‍රය ) 85326167 | 10, 000 | | |
| (2) ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව (නිදහස් චතුරශ්‍රය ) 85326186 | 4,000 | | |
| **මුළු එකතුව** | **14,000** | | |
| | | | |
| **සටහන් අංක 05** | | | |
| **වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු මුදල්** | | | |
| ලැබිය යුතු සාමාජික ගාස්තු | 3,731 | | |
| **මුළු එකතුව** | **3,731** | | |
| | | | |
| **සටහන් අංක 06** | | | |
| **පූර්ව ගෙවීම්** | | | |
| තොරතුරු තාක්ෂණ වියදම් | 30 | | |
| **මුළු එකතුව** | **30** | | |
| | | | |
| **සටහන් අංක 08** | | | |
| **අනෙකුත් ප්‍රතිපාදන සහ ගෙවීම්** | | | |
| (1) විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන | 75 | | |
| (2) ගෙවිය යුතු බදු | 17 | | |
| (3) වෙනත් ගෙවීම් | 7 | | |
| (4) ආදායම්බදු ගෙවීම් | 1, 086 | | |
| (5) වැට් බදු ගෙවීම් | 1,549 | | |
| (6) සාමාජිකත්වය අළුත් කිරීමේ අත්තිකාරම් | 3,454 | | |
| **මුළු එකතුව** | **6,188** | | |

## දේපල, යන්ත්‍රෝපකරණ, උපකරණ

## සටහන අංක :07

| පිරිවැය | 2019.01.01 දිනට ශේෂය | එකතු කිරීම් රු. '000 | බැහැර කිරීම් /ගැලවීම් | 2019.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | | 3,041 | | 3, 041 |
| පරිගණක සහ උපාංග | | 99 | | 99 |
| **මුළු එකතුව** | | **3140** | | **3140** |
| **ක්ෂය වීම්** | **2019.01.01** දිනට ශේෂය | එකතු කිරීම් | බැහැර කිරීම් /ගැලවීම් | **2019.12.31** දිනට ශේෂය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | | 101 | | 101 |
| පරිගණක සහ උපංග | | 3 | | 3 |
| **මුළු එකතුව** | | **104** | | **104** |
| **පොත් වල ශුද්ධ වටිනාකම** | | | | **3,036** |

**මූල්‍ය කාර්යසාධනය සඳහා ක්ෂයවීම් ගාස්තු පහත පරිදි සිදු කරන ලදී**

| ක්ෂය වීම් | වසර සඳහා ගාස්තු | වර්ෂය තුළ විලම්බිත ආදායම | අනාවර ණය කළ මුදල |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| භෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 101 | 101 | |
| පරිගණක හා උපාංග | 3 | 3 | |
| **මුළු එකතුව** | **104** | **104** | |

## සටහන අංක :09

| විලම්බිත ආදායම | 2019.01.01 දිනට ශේෂය | වර්ෂය තුළ එකතු කිරීම | වර්ෂය සඳහා ගාස්තු | | 2019.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| | | | ක්ෂය වීම් | නැවත ඇගයීම් ගැලපීම් / බැහැර කිරීම | |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| භෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | | 3,041 | (101) | | 2,940 |
| පරිගණක හා උපාංග | | 99 | (3) | | 96 |
| **මුළු එකතුව** | | **3,140** | **(104)** | | **3,036** |

**<u>ශුද්ධ වත්කම්/ හිමිකම් වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශයන්</u>** <u>දෙසැම්බර් 31 දිනට</u>

| සටහන අංක :10 | දායකත්ව ප්‍රාග්ධනය | සමුච්චිත ලාභය/ඌණතාවය | එකතුව |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| **2017 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙනා ශේෂය** | | | |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ ඌනතාව | | | |
| **2018 දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | | | |
| **2018 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙනා ශේෂය** | | | |
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය | | 13,611 | 13,611 |
| **2019 දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | | **13,611** | **13,611** |
| | | | |

## <u>ජාතික විගණන කාර්යාලයේ විගණක වාර්තාව</u>

මගේ අංකය : IEN/A/ECSL/FA/2019 2021 ජුනි 30 දින

සභාපති
ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

### 1. මූල්‍ය ප්‍රකාශනය

#### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක සහ 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්ථාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභා ගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය තුල මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය

සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්වාගණනය කළ ගිණුම්කරණ මතය සඳහා පදනම

අ) 2020 වර්ෂයට අදාල සාමාජික මුදල් සමාලෝචි වර්ෂයේ දී ලැබී නොතිබුණු නමුත් රු.3,730,32 ක් ලැබිය යුතු හා කලින් ලැබීම් වශයෙන් සාවද්‍ය ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ වල දක්වා තිබුණි

ආ) රජයේ ප්‍රධානයක් ලෙස ලැබුණු රුපියල් 3,140,000 ක් වූ ස්ථාවර වත්කම්වල ක්‍රමක්ෂය ආදායම් ප්‍රවේශය අනුව හඳුනාගන්නා බව අනුව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර තිබුණද සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රමක්ෂය අදායමක් ලෙස හඳුනානොගෙන ක්‍රමක්ෂය අගය ස්ථාවර වත්කම්වලින් හා ප්‍රාග්ධන ප්‍රදානයෙන් අඩුකර ගිණුම්කරණ ප්‍රතිපත්තියට පටහැනිව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

ඇ) සමාලෝචිත වර්ෂයේ තෙවන හා හතරවන කාර්තුව සඳහා වන් එකතු කළ අගය මත බදු වාර්තා අනුව පිලිවෙලින් ගෙවිය යුතු හා ලැබිය යුතු බදු මුදල රු.383,682ක් හා රු 668,366 ක් වුවද අදාල ගෙවිය විය යුතු හා ලැබිය යුතු බදු ගැලපීමකින් තොරව ගෙවිය යුතු බදු ශේෂය ලෙස රු.1,548,811 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිලිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වරදි හෙතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තිරනය කිරිම කළමනාකරණයේ වගකිම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකිමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමෙති විටදී මෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකිමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උපවගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලින මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය අදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිලිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගේන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගනකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහුරුවක් ලබාදීම සහ මගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රරමාණාත්මක

අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා සහ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනා ගැනීමේ දී හා තක්සේරු කිරීමේ දී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණවත්කම සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රභල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරිමට වංචාවක් ඇති වීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බධයෙන් අවබෝධයක් ලබාගන්න ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතකයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබද ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණ සදහා සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබද පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බධයෙන් වූ හෙළිදරව් කිරිමට මගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වූවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තරගතය ඇගයීමට ලක්කළ අතර ඒ සදහා පාදක වූ ගණුදෙනු හා සිද්ධින් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් බව අගයන් ලදී.

  මගේ විගණන තුලදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිලිබදව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සදහන් අවශ්‍යතාවන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 [අ] වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මගේ වාර්තාවේ තත්තවාගණනය කල මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

  අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 [ඇ] වගන්තියේ සඳහන් අවශ්‍යයතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ සමාජියෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 [ඊ] වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානාවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.
- 2018 අංක 19 දරන ජතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල, කර්තව්‍ය සහ කර්යයයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.
- 2018 අංක 19 දරන ජතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පදනය කර භාවිතා කර නොමැති බව.

## 2.1 වෙනත් විගණන නිරීක්ෂණ

කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ඉංජිනේරු සභාව සඳහා වූ තනතුරු 08 ක් සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් 09 දෙනෙකු අනුමත කර තිබුණි. අනුමත තනතුරු සඳහා බඳවා නොගෙන අනුමත නොකරන ලද තනතුරු 03 ක් ඇතිකර ඒ සඳහා රු. 621,387/= ක මුදලක් වැටුප් සහ දීමනා වශයෙන් ගෙවා තිබුණි. තනතුරු සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටි අනුමත කරගෙන තිබුණද ස්ථිර කාර්ය මණ්ඩලයට කිසිම සේවකයකු බඳවා ගෙන නොතිබුණි.

### <u>විගණන වාර්තාවට ප්‍රතිචාර දක්වීම</u>

#### <u>කාර්ය මණ්ඩලයක් බඳවාගැනිම</u>

පනත ස්ථාපනය කිරීමෙන් පසු, සභාවේ ප්‍රථම රැස්වීම 2018 අගෝස්තු 24 වන දින පවත්වන ලදී. ඉංජිනේරු සභාවට (ECSL) අයිති ස්ථිර ස්ථානයක් නොතිබූ බැවින්, 2019 සැප්තැම්බර් මාසය වන තුරු සියලුම රැස්වීම් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) දී පවත්වන ලදී. එසේම, ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ කටයුතු කරගෙන යාම සඳහා කාර්ය මණ්ඩලය නොසිටි බැවින් මේ පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුවට (MSD) ඉල්ලීමක් කරන ලදී. මූල්‍ය කටයුතු විනිවිදභාවයකින් යුතුව ඉටු කිරීම පිණිස ආරම්භයේ දී මූල්‍ය කළමණාකරුවෙකු පමණක් අර්ධ කාලින පදනම මත බඳවා ගන්නා ලදී. පසුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් කොළඹ - 7 ජාවත්ත පාරේ අංක 230 දරණ ස්ථානයේ ස්වකිය පරිශ්‍රය තුළ ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ

කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ඉඩකඩ වෙන්කර දුන් අතර අවශ්‍ය යටිතල පහසුකම් වැඩි දියුණුකර නව කාර්යාලය අතිගරු ජනාධිපතිතුමා විසින් 2019 සැප්තැම්බර් මස 17 වන දින විවෘත කරන ලදී.

කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව විසින් 2019 ඔක්තෝබර් මස 31 වන දින කාර්ය මණ්ඩලය බඳවාගැනීම සඳහා වූ බඳවා ගැනීමේ පරිපාටිය (SORP) අනුමත කරන ලදී. කෙසේ වුවද, 2019 ජනාධිපතිවරණ කාලය තුළ බඳවා ගැනීම් නතර කරනලෙස සියලුම රාජ්‍ය ආයතනවලට භාණ්ඩාගාරය විසින් උපදෙස් ලබා දී තිබුණු අතර 2019 නොවැම්බර් 20 වන දිනැති ලිපිය මගින් එම කාලය තව දුරටත් දීර්ඝ කරන ලදී.

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ කටයුතු පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව පනත මගින් සභාව වෙත පවරා ඇති බලතල ප්‍රකාරව තාවකාලික පදනම මත කුඩා කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට සභාව තීරණය කරන ලදී. වර්ෂ 2018 සහ 2019 කාලය තුළ පහත සඳහන් කාර්ය මණ්ඩලය බඳවාගන්න ලදී.

1. **සම්බන්ධීකරණ නිලධාරි**
   ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව පනතේ 24 වන වගන්තියෙන් නියම කර ඇති පරිදි ලේඛකාධිකාරීවරයෙකුගේ රාජකාරි ඉටුකිරීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති තැනැත්තෙක්. ( 2019 ඔක්තෝබර් මාසයේ දී)

2. **තොරතුරු තාක්ෂණ සම්බන්ධීකාරක**
   තොරතුරු තාක්ෂණයට අදාළ රාජකාරි සහ කාර්යාලයේ අනෙකුත් උපකාරක කටයුතු ඉටුකිරීම සඳහා. ( 2019 නොවැම්බර් මාසයේ දී )

3. **මූල්‍ය කළමනාකරු (අර්ධ කලීන පදනම මත)**
   මූල්‍ය කටයුතු ඉටුකිරීම සඳහා (2018 අගෝස්තු මාසයේ දී)